www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පැනනගිමින් පවත්නා පොලිස් රාජ්‍යයේ ජාත්‍යන්තර අර්ථභාරය

**The international significance of Sri Lanka's emerging police state**

2010 පෙබරවාරි 16

ශ්‍රී ලංකාවේ ආන්ඩුව පොලිස් රාජ්‍යයක් කරා පිම්මේ යන ගමන දිවයිනේ කම්කරු පන්තියට බරපතල අන්තරායක් එල්ලකරනවා පමනක් නොවේ, එය ලෝකය පුරා කම්කරුවන්ට කරන බරපතල අනතුරු ඇඟවීමක් ද වේ. රටින් රට නය අර්බුදය පුපුරායත් ම, ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය නියමකර සිටින දරුනු කප්පාදු මහජනතාව මත කඩාපාත් කරත්ම, ලෝකයේ අන් සෑම තැනකදී ම රාජපක්ෂගේ වැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රමයන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ලංකාවේ දැන් හටගෙන ඇති දේශපාලන ආතතිය පෙන්නුම් කරන්නේ, වඩාත් පලල්ව ලෝකය පුරා පැතිර පවත්නා සන්තතීන්ගේ අතිශයින්ම තියුනු ස්වරූපයකි. අවුරුදු 26 ක් තිස්සේ ම්ලේච්ච වර්ගවාදී යුද්ධයක ගිලී පැවති රට එහි අවසානයක් දැක ගත්තේ පසුගිය මැයි මාසයේ එල්ටීටීඊ සංවිධානය පරාජය කිරීමත් සමඟය. රාජපක්ෂ 2006 වසරේ යලි ඇරඹූ යුද්ධය අතිශය මෘග ආකාරයකින් ක්‍රියාත්මක කලේය. ඔහු කියා සිටියේ තමා මේ රටට ''සාමය හා සමෘද්ධිය'' ගෙන එන බවය.

සැබවින්ම සිදුවූයේ එහි අනෙක් පැත්තය. යුද්ධයේ අවසානය යටින් පැවති එකදු ගැටලුවක් හෝ විසදාලූයේ නැත. සාපරාධී යුද්ධයට වියදම් කිරීම සඳහා මුලු රටම උකස් තබූ රාජපක්ෂට සිදුවූයේ මහා ගෙවුම් ශේෂ අර්බුදයක් වලක්වා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමූඅ) ඩොලර් බිලියන 2.6 ක නයක් ගැනීමටය. දැන් මූල්‍ය අරමුදලේ පදයට නැටීමට සිදුව තිබෙන ආන්ඩුව, වැඩකරන ජනයාගේ ජීවන තත්වයන් දරුනු ලෙස වනසා දැමීම සඳහා සැරසෙමින් සිටියි.

මහා සමාජ පිපිරීම් අපේක්ෂා කරන රාජපක්ෂ, ඒවාට මුහුන දීම සඳහා රාජ්‍ය යාන්ත්‍රනය මත තම ග්‍රහනය දැඩිකර ගැනීමට කැසකවමින් සිටියි. යුද්ධය සමයේදී ඔහු පාලනය ගෙනගියේ, වඩ වඩාත් නෑදෑයින්ගෙන් ද සමීප උපදේශකයින්ගෙන් ද හමුදා ජෙනරාල් වරුන්ගෙන් ද සමන්විත, පාර්ලිමේන්තුව නොතකා හල, ව්‍යවස්ථාමය නීති රීති හා ප්‍රමිතීන් කෙරේ පිලිකුලක් දැක්වූ ජනාධිපති කල්ලියක් තුලිනි. ජනාධිපති, වැඩවර්ජන තහනම් කිරීමට ද මාධ්‍ය තර්ජනයට ලක් කිරීමට ද නඩු විභාග වලින් තොරව පලල් ලෙස හිරේ විලංගුවේ දැමීම සඳහා ද දැනටත් ක්‍රියාත්මකවන හදිසි නීතිය යටතේ තම පුලුල් බලතල යොදා ගත්තේය. ආරක්ෂක හමුදාවල අනුබලය ඇතිව ක්‍රියාත්මකවූ ආන්ඩුවට සම්බන්ධ මිනීමරු කල්ලි විසින් දේශපාලකයන් හා පුවත්පත් කලාවේදීන් ද ඇතුලු සිය ගනනක් මරා දැමුනි.

එල්ටීටීඊය පරදවා ලබාගත් යුද ජයග්‍රහනය පාවිච්චි කර වාසි ලබාගැනීමට ගනන් බැලූ රාජපක්ෂ, අවුරුදු දෙකකට පෙර ජනාධිපතිවරනය කැඳවා දිගටම බලයේ රැඳී සිටීමට සැලසුම් කලේය. පසුගිය ජනවාරි 26 දා දරුනු ගැටුම් මධ්‍යයේ පැවති

ජනාධිපතිවරනයේදී, විපාක්ෂික දේශපාලන පක්ෂ ඔහුට එරෙහිව ඉදිරිපත් කලේ ඉහලම පෙලේ හිටපු ජෙනරාල්වරයා වූ සරත් ෆොන්සේකාය. රාජපක්ෂගේ ඇතුලත කවයේ කොටස්කරුවෙකු වූ ෆොන්සේකා, ජනාධිපති සමග විරසක වීමෙන් පසුව මැතිවරනය තරග කිරීම සඳහා පසුගිය නොවැම්බරයේදී තනතුරෙන් ඉවත් විය.

රාජපක්ෂගේ මැතිවරන ජයග්‍රහනය, කිසිදු ප්‍රශ්නයක් විසඳනවා වෙනුවට විස්තර කල හැකි එකම ආකාරයට අනුව, රටේ පාලක පැලැන්තිය ඇතුලත කන්ඩායමික කලිකලහයක් පමනක් ඉතුරු කලේය. පරාජය පිලිගැනීම ප්‍රතික්ෂේප කල ෆොන්සේකා, නීතිය හමුවට යන බවට අභියෝග කලේය. පසුගිය සතියේ ආන්ඩුව ඊට ප්‍රතිචාර දැක්වූයේ, හිටපු ජෙනරාල්වරයා මිලිටරි අත්අඩංගුවට ගැනීමෙනි. ඒ, රාජපක්ෂ පෙරලා දැමීම සඳහා ඔහු කුමන්ත්‍රනය කල බවට සැලකිය යුතු කරම් චෝදනා ඇතැයි යන පදනම මතය.

ඉන් දිනකට පසුව ජනාධිපති විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර අප්‍රෙල් 8 දිනට මහමැතිවරනයක් නියම කරන ලදී. දැන් එය පැවැත්වෙනු ඇත්තේ භීතිය හා ත්‍රස්තයේ වාතාවරනයක් තුලය. ආන්ඩුව කියා සිටින්නේ තමන් මේ මැතිවරනය තුලින් තුනෙන් දෙකකට වැඩි ආසන සංඛ්‍යාවක් ලබාගැනීමට අපේක්ෂා කරන බවයි. එමගින් ආන්ඩුව ව්‍යවස්ථාව වෙනස්කොට රාජපක්ෂගේ අත්තනෝමතික පාලනයේ සෙලුව වසාගැනීමට නීතිමය කඩතුරාවක් සපයා ගැනීමට අපේක්ෂා කරයි

ලංකාවේ දේශපාලන සංස්ථාපිතය තුල උනුන් කුලල් කා ගැනීම කෙතරම් විසකුරු වුව ද මෙම කන්ඩායමික ගැටුම් හුදෙක්ම උපායාත්මක ප්‍රශ්න මුල්කරගත් ඒවා ය. ඔවුන් අතර ඇති මතභේදය නම් වැඩකරන ජනතාව මත තව තවත් ආර්ථික බර පටවන්නේ කෙසේ ද යන්න හා දැන් කඳවුරු ගැසෙමින් සිටින්නාවූ මහා බලවතුන් අතර, විශේෂයෙන්ම එක්සත් ජනපදය හා චීනය අතර, තියුනුවන සට්ටනයේදී තමන් පෙලගැසී ගත යුත්තේ කොතැන ද යන්නය.

රාජපක්ෂගේ ආන්තික පියවරයන් වනාහි, දිවයිනේ පන්ති ආතතීන් පුපුරන සුලු මට්ටමකට වැඩීගෙස් තිබෙන බව පෙන්නුම් කරන නොවරදින ඇඟවුමකි.

මේ දිනවල ජාත්‍යන්තර මාධ්‍ය ශීර්ෂ පාඨවල ප්‍රමුඛත්වයට පත්ව තිබෙන ග්‍රීසියේ ගෙවාගත නොහැකි නය කන්දරාව තරම්ම පරිමාවක්, ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය විසින් ද අත්කර දී තිබේ. 2009 ප්‍රථම මාස දහය ඇතුලත ලංකාවේ සමස්ත නය රුපියල් ට්‍රිලියන හතරක් දක්වා ඉහල නැංගේය. (එක්සත් ජනපද ඩොලර් බිලියන 35) ජාත්‍යන්තර ජාමූඅ අනුව, 2008 වසර වනවිට සමස්ත රාජ්‍ය නයෙහි අනුපාතය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 87 කට ලගාවී තිබුනි. අයවැය හිගය දදේනි සියයට 11.3 ක් දක්වා වැඩී ගිය අතර 2011 වසර අවසන් වන විට මෙම අනුපාතය සියයට 5 දක්වා පහතට ගෙනආ යුතු බව ජාමූඅ කියා ඇත.

හොංකොං හා ෂැංහයි බැංකු සමාගමේ (එච්එස්බීසී) ප්‍රධාන අර්ථශාස්ත්‍රඥයෙකු වන රොබට් ප්‍රයර් වොන්ඩෙස්ෆොර්ඩ් පසුගිය සතියේ කොලඹදී පැවැති සාකච්ඡාවකදී ප්‍රකාශ කලේ, පොදු වියදම් කපාහැරීමේදී ආන්ඩුව දැනට වඩා බොහෝ දුර යා යුතු බවය. රාජපක්ෂ ආන්ඩුවේ ආර්ථික ඉලක්කම් ප්‍රතික්ෂේප කල වොන්ඩස්ෆෝර්ඩ් මෙසේ පැවසීය. ''ඔහු (රාජපක්ෂ) ත්‍රස්ත (එල්ටීටීඊ) විරෝධී යුද්ධයේදී දුන් විසඳුම මෙහිදී ද දිය යුතුය. ශ්‍රී ලංකාවට තම සැබෑ ශක්‍යතාව සාක්ෂාත් කරගත නොහැකිව ඇති එක් තැනක් නම්, පොදු වියදම් සම්බන්ධයෙන් දැන් කෙරීගෙන යන ඉවබව නැති, නාස්තිකාරී හා දූෂිත වැඩ පිලිවෙල යි.''

දැන් ශ්‍රී ලංකාව තුල ග්‍රීසියේ වැනි ආර්ථික පියවර ගත යුතුව තිබේ. ඊටත් වඩා පුලුල් පරිමානයකිනි. එයින් ඇඟවුම් කෙරෙන අනෙක් දෙය නම්, දැන් මෙරට ක්‍රියාත්මක කරන දේශපාලන පිලිවෙත් ග්‍රීසියේ ද අනෙක් රටවල ද ක්‍රියාවට නැඟිය යුතු බවයි. අලුතින් ආර්ථික බර පැටවීමකට එරෙහිව ග්‍රීසිය තුල මෙන්ම ජාත්‍යන්තර පරිමානව ද මහජන විරෝධය නැඟ එනු ඇත. මෙම අර්බුදය ශ්‍රී ලංකාව වැනි පසුගාමී රටවලට පමනක් බලපාන්නක් නොවේ. ග්‍රීසිය, පාතුගාලය, ස්පාඤ්ඤය හා අයර්ලන්තය වැනි ගැටුම් සහගත යුරෝපීය රටවලට පමනක් සීමාවූවක් ද නොවේ. ග්‍රීසිය නය ගෙවීම පැහැර හැරියොත් එය ජර්මනියට හා ප්‍රංශයට තදින් බලපා, මුලු මහත් යුරෝපීය සංගමය හරහා ප්‍රතිරාව දනවනු ඇත. බ්‍රිතාන්‍ය හොඳටම නයගැතිය. එක්සත් ජනපදය ද එසේමය. දළ දේනි සියයට 10.6 ක මට්ටමේ සිය අයවැය හිඟය රඳවා ගැනීමට එරට සමත්ව ඇත්තේ හුදෙක් එරට මුදල වන ඩොලරය ජාත්‍යන්තර සංචිත මුදල ලෙස පවත්නා හෙයින් පමනි.

වත්මන් ගෝලීය ආර්ථික අර්බුදය තාවකාලික සංසිද්ධියක් නොවේ. එය පැන නඟින්නේ දෙවන ලෝක යුද්ධයෙන් (1939=45) බිඳවැටුනු ලෝක ධනේශ්වර පර්යායේ සමතුලිතය යලි පිහිටුවාලූ, සකල යාන්ත්‍රනයන් බිඳවැටීමේ ප්‍රතිපලයක් ලෙසය. පශ්චාත් යුදකාලීන පුනස්ථාපනයේ කේන්ද්‍රීයස්ථානය වූ ඇමරිකා එක්සත් ජනපදය ආර්ථික පරිහානියක ගිලී ඇත. දැන් එය වත්මන් මූල්‍ය කලබැගෑනියේ කේන්ද්‍රස්ථානය බවට පත්ව තිබේ. සමස්තයක් ලෙස ගෝලීය ආර්ථිකයේ හෝ විශේෂිත ආරථිකයන්හි කෙටිකාලීන උච්චාවචනයන් මොනවා වුව ද ලෝකය දැන් ප්‍රවිශ්ටවී ඇත්තේ කම්කරු පන්තියට දරුනු දේශපාලන ප්‍රති විපාක ගෙන එන්නාවූ ආර්ථික බිඳවැටීම්වල නව කාල පරිච්චේදයකටය.

ශ්‍රී ලංකාවේ දැන් දක්නට ලැබෙන මෙම බරපතල අනතුරු ඇඟවීම් ගනන් නොගන්නා කවුරුන් වුව ද බරපතල වැරැද්දක් කර ගත්තා වනු ඇත. මෙම කුඩා දිවයින එහි ඉතිහාසය ද ලෝක ආර්ථිකයට දරන්නාවූ සම්බන්ධතාවය ද නිසා බොහෝවිට ජාත්‍යන්තරව සිදුවෙමින් පවත්නා ආර්ථික හා දේශපාලන සන්තතීන් තියුනුව පිලිඹිඹු කරයි. අවසාන විග්‍රහයේදී උග්‍රවන්නාවූ ආර්ථික හා සමාජ ආතතීන් හමුවේ මුලු ලෝකයේම පාලක ප්‍රභූන් තමන්ගේ වරප්‍රසාදිත තත්වයන් රැකගැනීම සඳහා දැන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නාවූ වර්ගයේ විධික්‍රමයන් යොදාගනු ඇත.

කම්කරු පන්තිය අවශ්‍ය නිගමනය වහා උකහා ගත යුතුය. එනම්, තමන්ගේ මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා ජීවන තත්වයන් ආරක්ෂා කර ගතහැකි වන්නේ වත්මන් සමාජ ක්‍රමය හංගකර දමා, ධනපතියන් අතලොස්සකගේ ලාභ නොව අති මහත් බහුතරයකගේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකිවන පරිදි සමාජය සමාජවාදී පදනමක ප්‍රති ව්‍යුහගත කිරීම මඟින් පමනක් බවය.

**කේ රත්නායක**